(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 6(5).]

# පාර්ලිමේන්තුවේ අංක 6 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2012 ජූලි මස 31 වැනි අඟහරුවාදා

## 2012 අගෝස්තු මස 21 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2109/'11

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල විසින් සීමාසහිත ගලදාරි හෝටල් ලංකා සමාගම, සීමාසහිත ලාෆ්ස් ගෑස් සමාගම සහ සීමාසහිත සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගම යන සමාගම්වල ලබාගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කොටස් ප්‍රමාණයන් මිලදී ගත් දිනයන් කවරේද;

(iii) ඉහත කී කොටස් ගත් මිල කවරේද;

(iv) එම කොටස් මිලට ගත්තේ කවර පුද්ගලයන්ගෙන්ද;

(v) ඉහත කී කොටස් මිලට ගැනීමෙන් පසු විකුණන ලද්දේ නම්, එම එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද්දේ කවර පුද්ගලයින් හටද;

(vi) ඉහත කී එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද මිල කවරේද; සහ

(vii) මෙම ගනුදෙනුවලට සම්බන්ධවූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2345/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකවන ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් කටයුතු කරන රජයේ ආයතනය කුමක්ද;

(ii) එම ආයතනය විසින් ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ඉටු කරනු ලබන කාර්යභාරයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට ක්‍රියාත්මක වන ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව;

(ii) ඒවායේ රැකවරණය ලබන ළමුන් සංඛ්‍යාව;

(iii) ඒවායේ සේවය කරන පාලිකාවන් හා සහායිකාවන් සංඛ්‍යාව;

එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2425/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ විදුලිය නිපදවීම ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම විදුලි බලාගාරය මගින් ජාතික විදුලිබල පද්ධතියට තථ්‍ය වශයෙන්ම එකතු කරන විදුලි ඒකක ප්‍රමාණය කොපමණද;

(iii) එම බලාගාරයෙන් එක් විදුලි ඒකකයක් නිපදවීමට දිනකට වියදම කොපමණද;

(iv) විවෘත කිරීමෙන් පසුව නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය අක්‍රිය වූ වාර ගණන කොපමණද;

(v) අවසන් වරට එය අක්‍රිය වූ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම විදුලි බලාගාරය සඳහා කළ වියදම නිරර්ථක වී ඇති බව පිළිගන්නේද;

(ii) එම ව්‍යාපෘතිය අසාර්ථක වීමට අදාළ වගකිවයුත්තන් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, ඔවුන් සම්බන්ධයෙන් ගෙනඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2348/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් නිර්දේශකර ඇති පරිදි ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථානයක රැකවරණය ලැබිය හැකි දරුවකුගේ උපරිම හා අවම වයස් සීමාවන් කවරේද;

(ii) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාව තුළ ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථානවල ළමුන්ගේ රැකවරණය සම්බන්ධයෙන් වාර්තා වී ඇති චෝදනා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2427/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ප්‍රධාන ආපනශාලාව බදු දී ඇති ආයතනය කවරේද;

(ii) එම ආයතනයට රෝහල් ආපනශාලාව බදු දුන් දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ආයතනය යටතේ පාලනය වන රෝහල් ආපනශාලාව මගින් සේවකයන්ට හා රෝගීන්ට සහන ගාස්තු මත ආහාරපාන සපයන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම ආයතනය මගින් පාන්පිටි නිෂ්පාදනවලට අමතරව වෙනත් ආහාර ලබාදෙන්නේද;

(ii) දියවැඩියා රෝගීන් සඳහා එම ආපනශාලාව මගින් ලබාදෙන පාන්පිටි නොවන ආහාර කවරේද;

(iii) එම ආපනශාලාව මගින් දියවැඩියා රෝගීන් හා අනෙකුත් රෝගීන් සඳහා පාන්පිටි නොවන ආහාර ලබාදීම ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2781/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012.05.01 දින යාපනයේ පැවති ඒකාබද්ධ විපක්ෂයේ මැයි රැළියේදී කොටි සංවිධානයට අයත් කොඩියක් යම් අයෙකු විසින් ප්‍රදර්ශනය කරන රූපරාමු ඇතුළත් ප්‍රවෘත්තියක් ස්වාධීන රූපවාහනි සේවය ඔස්සේ විකාශය කළේද;

(ii) ස්වාධීන රූපවාහිනි සේවයට අයත් මාධ්‍යකරුවෙක් හෝ කණ්ඩායමක් විසින් එකී මැයි රැළිය රූගත කරනු ලැබුවේද;

(iii) නොඑසේ නම්, කොටි සංවිධානයට අයත් කොඩියක් ප්‍රදර්ශනය කිරීමේ දර්ශන ඇතුළත් වීඩියෝ පටය ස්වාධීන රූපවාහිනී සේවයට ලබා දුන් පුද්ගලයා කවුරුන්ද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ස්වාධීන රූපවාහිනි සේවය විසින්,

(i) ඉහත වීඩියෝ පටයේ අව්‍යාජභාවය හෝ නිරවද්‍යභාවය තහවුරු කරගනු ලැබූ ආකාරය කවරේද;

(ii) ඉහත කී දර්ශන ඇතුළත් රූපරාමු විකාශය කරන ලද වාර ගණන කොපමණද;

(iii) එම දර්ශන විකාශය කරන ලද දින හා වේලාවන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2012 අගෝස්තු මස 21 වැනි අඟහරුවාදා)

2203/'11

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු නොලබන, පසුගිය වර්ෂ දහය තුළදී පිහිටුවනු ලැබූ, රජයට අයත් සියලුම සමාගම්වල නම් කවරේද;

(ii) ඉහත සඳහන් සමාගම් රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන්නේද;

(iii) නොඑසේ නම්, එම සමාගම් අධීක්ෂණය කරනු ලබන්නේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ දහයක කාලය තුළ,

(i) රජය විසින් කිසියම් බද්දක් අයකර ගෙන ඇති හෝ රජය වෙත ලාභාංශ ලබා දී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) රජය විසින් මුදල් ගෙවන ලද, එහෙත් රජය වෙත කිසිදු මුදලක් ආපසු ලබාදී නොමැති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ආයතනය වෙත රජය විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආයතන සමස්තයක් ලෙස, එක් එක් වර්ෂය සඳහා ලාභයක් හෝ අලාභයක් ලැබුවේද;

(v) එම එක් එක් ආයතනයේ සේවය කරන සේවකයින් සංඛ්‍යාව කවරේද; සහ

(vi) රජය විසින් එම එක් එක් ආයතනය සඳහා යොදවන ලද සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණය කවරේද;

යන්නත් ඉහත (ආ) (i) හි සඳහන් කළ සමාගම්වලට අදාළව එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2302/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 1990 සිට 2011 දක්වා කාල සීමාව තුළදී අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලබා දී ඇති පත්වීම් සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව, දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අවසන් වරට සිදුකරන ලද ගුරු වැටුප් සංශෝධනය අනුව ගුරු සේවයේ එක් එක් ශ්‍රේණිය සඳහා හිමි මූලික මාසික වැටුප වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) රජයේ ගුරුවරුන්ට මාසික වැටුපට අමතරව හිමිවන වරප්‍රසාද හා දීමනා ගුරු සේවයේ එක් එක් ශ්‍රේණිය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2303/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1990 සිට 2011 දක්වා කාල සීමාව තුළ ඩෙංගු වැළඳීම, රිය අනතුරු, සියදිවි නසා ගැනීම, ආහාර විෂවීම, කායික හෝ මානසික අතවරයන්ට ලක්වීම යන හේතු මත රෝහල්ගත කළ / මිය ගිය පාසල් ළමුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය වර්ෂය තුළ විවිධ වරදවල් යටතේ චෝදනා ලබා ළමා අධිකරණයට යොමු කර ඇති පාසල් සිසුන් සංඛ්‍යාව, ඔවුන් අයත්වන වයස් කාණ්ඩය හා පාසල අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2461/'12

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඬ්ඩාලච්චේන 14, කොමන් පාරේ, අංක 4/5 දරන ස්ථානයේ පදිංචි එම්. ඒ. අබාජුල්ෆාන් මහතා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට 2006.06.01 දින පෙනී සිට ඇති බවත්;

(ii) සියලු සුදුසුකම් සපුරා සිටියත් ඉහත තනතුරට පත්කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට මෙතෙක් ඔහුගේ නම නිර්දේශකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත කාරණයට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද (HRC/2775/09) නිර්දේශය ක්‍රියාවට නංවමින් (අංක 17/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව) ඔහුට හිමිවිය යුතු උසස්වීම ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2462/'12

ගරු මොහමඩ් අස්ලම් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අකුරණ, දොඩම්ගොල්ලේ, අංක 233/1 දරන ලිපිනයේ පදිංචි, කුරුගොඩ මුහන්දිරම්ලාගෙදර නූර් මුහම්මද් සෙයියද් මුහම්මද් මහතා විසින් නුවරඑළිය මහ නගර සභාව සතු "කාර්ගිල්ස් පිටිය" වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමරයක් බද්දට ලබා ගැනීම සඳහා වර්ෂ 1993.01.04 දින රුපියල් ලක්ෂයක මුදලක් සහ 2002.09.25 දින රුපියල් අනූදහසක මුදලක් තැන්පත් කරනු ලැබුවත් මෙතෙක් ඒ මහතාට කඩ කාමරය ලබාදී නොමැති බවත්;

(ii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනයකට අනුව සෙයියද් මුහම්මද් මහතාට අදාළ කඩ කාමරය හිමිවිය යුතු බවට ලබා දුන් නිර්දේශය (HRC/K/429/06/11) එම පළාත් පාලන ආයතනය විසින් පැහැර හරිමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත නිර්දේශය ක්‍රියාවට නැංවීමෙන් වැළකී අංක 17/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය උල්ලංඝනය කරමින් සිටින නුවරඑළිය මහ නගර සභාවේ වගකිව යුත්තන්ට එරෙහිව අපක්ෂපාති පරීක්ෂණයක් පැවැත්වීමටත්, සෙයියද් මුහම්මද් මහතාට සාධාරණය ඉෂ්ට කිරීමටත් පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 අගෝස්තු මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2349/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 වන විට එක් එක් පළාත් සභාව යටතේ ලියාපදිංචි කර ඇති පෙර පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පෙර පාසල් සහ පෙර පාසල් ගුරුවරු ලියාපදිංචියට අදාළ ප්‍රඥප්ති හෝ නීති සම්පාදනය කොට ඒ අනුව කටයුතු කරන පළාත් සභා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2502/’12

ගරු තලතා අතුකෝරල මහත්මිය,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුළුතොට, කඩමුදුන පිහිටි සංචාරක නිවාසය ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයට අයත් වන්නේද;

(ii) එම සංචාරක නිවාසය මේ වනවිට නිවාස සංවර්ධන අධිකාරිය මගින් බදුදී තිබේද;

(iii) එය බදු දීමේදී පිළිගත් ටෙන්ඩර් පරිපාටියක් අනුගමනය කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත්වූ මිල ගණන් කවරේද;

(v) එම සංචාරක නිවාසය බදු දුන් ටෙන්ඩරයේ වටිනාකම කවරේද;

(vi) එම ටෙන්ඩරය ඉදිරිපත්වූ වැඩිම වටිනාකමින් යුතු ටෙන්ඩරය නොවන බව පිළිගන්නේද;

(vii) එසේ නම්, එම බදු ගිවිසුම අවලංගු කර නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2623/’12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දුම්රිය දෙපාර්තමේන්තුවේ II වැනි පන්තිය තාක්‍ෂණික ශිල්පීන් බඳවා ගැනීම සඳහා ලිඛිත පරීක්‍ෂණයක් 2010/07/31 දින පවත්වනු ලැබුවේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් තාක්ෂණික ශිල්පීන් බඳවා ගැනීමට,

(i) ලිඛිත විභාගයක් පැවැත්වීමට අදාළ ගැසට් නිවේදනය පළ කළ දිනය;

(ii) ප්‍රායෝගික පරීක්‍ෂණ පවත්වන ලද දිනය;

(iii) සම්මුඛ පරීක්‍ෂණ පවත්වනු ලැබූ දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දුම්රිය දෙපාර්තමේන්තුවේ පවතින ඉහත (ආ) හි සඳහන් පරීක්ෂණ සමත්වන්නන්ගෙන් පිරවීමට අපේක්ෂිත II වැනි පන්තිය තාක්‍ෂණික ශිල්පීන් තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2778/’12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) සන්නිවේදන කටයුතු උදෙසා ශ්‍රී ලංකාවට ඉහළ අහසේ චන්ද්‍රිකාවක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතියෙන් ළඟා කර ගැනීමට අපේක්ෂා කරන අරමුණු කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2849/'12

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය විවිධසේවා සමූපකාර සමිතියට අයත් දෙමහල් ගොඩනැගිල්ලක් බදු දීමට 2011 දෙසැම්බර් 19 දින පුවත්පත් දැන්වීමක් මගින් ටෙන්ඩර් කැඳවූයේද;

(ii) එසේ නම්, ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iii) පිළිගත් පටිපාටිය අනුව ටෙන්ඩර් කැඳවීමකදී සලකා බලන සහ ප්‍රමුඛතාවය ලබා දෙන කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ගොඩනැගිල්ල,

(i) ලබා ගැනීමට රුපියල් 320,000/- ක් සහ රුපියල් 355,000/- ලෙස මිල ගණන් ඉදිරිපත්ව තිබූ බවත්;

(ii) ටෙන්ඩර් අයදුම්පතක් හෝ ඉදිරිපත් නොකළ පුද්ගලයකුට මේ වන විට ලබා දී ඇති බවත්;

(iii) බදු දීමේදී අක්‍රමිකතාවයක් සිදු වී ඇති බවත්;

(iv) අක්‍රමිකව ලබාදීම නිසා අයදුම්කරුවන්ට අසාධාරණයක් මෙන්ම අදාළ සමූපකාර සමිතියට අලාභයක් සිදුව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහළම ටෙන්ඩරයට ගොඩනැගිල්ල ලබා නොදීමට හේතු කවරේද;

(ii) දැනට ගොඩනැගිල්ල ලබා දී ඇති අයගෙන් සමූපකාර සමිතිය ලබා ගන්නා මුදල කොපමණද;

(iii) ඉහත අක්‍රමිකතාව සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකොට ටෙන්ඩර් කරුවන්ට සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2350/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය වනවිට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිය ලබා ඇති පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාවන් කවරේද;

(ii) එම පාඨමාලාවන් පවත්වනු ලබන ආයතනවල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාවක් හදාරා ඇති පෙර පාසල් ගුරුවරු සංඛ්‍යාව එක් එක් පළාත හෝ දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2012 අගෝස්තු මස 22 වැනි බදාදා)

1631/'11

ගරු රාජිව විජේසිංහ මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත යටතේ,

(i) යම් කිසි ඉල්ලීමක් මත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනය අවසන් වන තෙක් අධිකරණය විසින් අතුරු ආරක්ෂණ නියෝගයක් නිකුත් කළ යුතු බවත්;

(ii) ඉල්ලීම ඉදිරිපත් කළ දින සිට දින 14ක් ඇතුළත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමට අධිකරණය විසින් නියෝගයක් නිකුත් කළ හැකි බවත්; සහ

(iii) අතුරු ආරක්ෂණ නියෝගයක් මාස 12 නොඉක්මවන කාල සීමාවක් සඳහා බල පැවැත්වෙන බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) එම නම් කරන ලද කාල සීමාවට පසු විමර්ශන නොපැවැත්වූ සහ විමර්ශන පැවැත්වූ නඩු කවරේද;

(ii) මෙම නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවූ මහේස්ත්‍රාත්වරුන්ට මග පෙන්වීම සඳහා යොදා ගන්නා ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ එම නිසා ප්‍රමාදයන්ට ලක්වූ වින්දිතයන්ට ගෙවීමට තිබෙන වන්දි ප්‍රමාණය කවරේද;

(iii) අතුරු නියෝග නොවන නියෝග සඳහා අවසන් දිනයක් තිබීමටත්, අතුරු නියෝග සඳහා එවන් දිනයක් නොතිබීමටත් හේතුව කවරේද;

(iv) එම විෂමතාව නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1632/'11

ගරු රාජිව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) 2001 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී, 1841 අයාල ආඥාපනත යටතේ අත්අඩංගුවට ගත් සහ රක්ෂිත බන්ධනාගාරගත කළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කොට සිටි අය අතුරින් තවමත් බන්ධනාගාරගතව සිටින හෝ වෙනත් ස්ථානවල රඳවා සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අයාල ආඥාපනතෙහි සඳහන් වන "නිවැරදි කළ නොහැකි නොදැමුණු පුද්ගලයන්" (Incorrigible Rogues) යන පදයෙහි අර්ථය කවරේද;

(ii) එම පදය භාවිතාකොට ඇත්තේ කවර අරමුණකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයාල ආඥාපනතට සිදු කරන ලද වෙනස්කම් පිළිබඳව 2004 වසරේදී මානව හිමිකම් කොමිසම ඉදිරියේ නිර්දේශ ඉදිරිපත් කරන ලද බව පිළිබඳව සහ ඒවා භාවිතා කරන ආකාරය එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා පියවර ගනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, එම ආඥාපනත යටතේ වන ව්‍යවහාරයන් සඳහා වන වෙනස් කිරීම් තහවුරු කිරීමට ගනු ලබන අනෙකුත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2073/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත පරිප්පු සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනයකර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් පරිප්පු සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2074/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත සීනි සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනයකර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් සීනි සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2075/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත බිත්තර සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් බිත්තර සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2076/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ ලක් සතොස ආයතන පිහිටුවා ඇති ස්ථාන කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත කුකුල් මස් සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනයකර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් කුකුල් මස් සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 අගෝස්තු මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2351/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට කිසිදු අධිකාරියක් යටතේ ලියාපදිංචියක් ලබා නොමැති පෙර පාසල් විශාල සංඛ්‍යාවක් පවතින බවත්;

(ii) අදාළ අවම සුදුසුකම්වත් නොමැතිව දීර්ඝ කාලයක සිට පෙර පාසල්වල සේවය කරන ගුරුවරුන් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ගුරුවරුන් හා පෙර පාසල් විධිමත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පෙර පාසල් ගුරුවරුන් සඳහා රජයෙන් කිසියම් ස්ථිර මාසික වැටුපක් ගෙවීම සඳහා කටයුතු කිරීමට කොතරම් කාලයක් ගතවේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2721/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියා දිස්ත්‍රික්කයේ "නැදුන්කර්නි ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ජල සම්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2780/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අද වන විට ශ්‍රී ලංකාව තුළ රූපවාහිනී සේවාවන් පවත්වාගෙන යාම සඳහා,

(i) ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍ර ලබාදී ඇති තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ලබා දී ඇති එක් එක් බලපත්‍රය වෙනුවෙන් උක්ත නම් සඳහන් බලපත්‍රලාභීන්ගෙන් අය කරගෙන ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2354/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පෙර පාසල් සම්බන්ධයෙන් නොයෙක් ගැටලුකාරී තත්ත්වයන් පවතින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) වර්ෂ 2005 සිට 2010 දක්වා, ළමුන්ගේ රැකවරණය හෝ සංවර්ධනය කඩවීම සම්බන්ධයෙන් පැමිණිලි හෝ චෝදනා ලබා ඇති පෙර පාසල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ පෙර පාසල් සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳව මේ වනවිට අවධානය යොමුකර තිබේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2784/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා වෙත යවන ලද 2011.01.03 දිනැති අංක එම්පීඒ/ඒඩී9/පීපීසී/2007/25 දරන ලිපිය මගින් එස්. බී. විමලවීර සහ පතිරගේ නිහාල් පෙරේරා යන දෙදෙනාට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව අවධානය යොමුකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා විසින් ඉහත නම් සඳහන් සේවකයින්ට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශවලට ගරු නොකිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2809/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මැදවච්චිය ප්‍රාදේශීය සභාවට අයත්, අංක 63 මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් උඩුඹුගල ප්‍රදේශවාසීන් විසින් ඉල්ලීමක් කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට සහ කනදරා ඔය හරහා පාලමක්ද ඉදිකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2012 අගෝස්තු මස 23 වැනි බ්‍රහස්පතින්දා)

2722/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් දිස්ත්‍රික්කයේ "වෙඩිතලතිව් ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2723/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් දිස්ත්‍රික්කයේ මාන්තායි වෙරස් ප්‍රදේශයේ නව ජල සම්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2724/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් දිස්ත්‍රික්කයේ "අඩරිජන් ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2725/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ "වැල්වැටිතුරේ ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2726/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ "මුරුක්කන්කර්නි ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2727/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ උතුරු මාන්තායි ප්‍රදේශයේ "පඩියන්කුලම් ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අදාළ ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2728/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ "ඔඩ්ඩුසුඩාන් ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2729/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2730/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ "මල්ලවි ජල සම්පාදන ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා දැරීමට අපේක්ෂිත මුළු පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 අගෝස්තු මස 24 වැනි සිකුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2110/'11

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පිහිටි වාණිජ බැංකුවල, සේවක අර්ථසාධක අරමුදල මගින් හිමිකාරීත්වය දරන කොටස් හිමිකමේ වටිනාකම, එම එක් එක් බැංකුව අනුව කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් සමාගමේ කොටස් ප්‍රමාණයන් මිලදීගත් දිනයන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ කොටස් හිමිකම මිලදීගනු ලැබුවේ කවර පුද්ගලයකු සහ/හෝ පුද්ගලයින්ගෙන්ද;

(iv) එම එක් එක් කොටස් ප්‍රමාණය මිලදීගනු ලැබූ වටිනාකම කවරේද;

(v) ඉහත සඳහන් අයුරින් මිලදීගත් කොටස් පසුව විකුණා ඇත්නම්, එම කොටස් විකුණූ මිල කවරේද සහ එම කොටස් විකුණනු ලැබුවේ කවර පුද්ගලයන්ටද;

(vi) එලෙස කොටස් හිමිකාරීත්වය දරන එක් එක් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා රජය සහ/හෝ සේවක අර්ථසාධක අරමුදල හෝ විසින් නම් කළ අයගේ නම්, තනතුරු සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2346/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචිය කළ යුතු ආයතනය කවරේද;

(ii) 2000, 2005 සහ 2010 වර්ෂවලදී එම ආයතනය යටතේ ලියාපදිංචි වී ඇති ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව, ඒවාට අදාළ ළමුන් සංඛ්‍යාව, පාලිකාවන් සංඛ්‍යාව සහ සහායිකාවන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2473/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට සහනාධාර ලබා දෙන ධීවරයින් සංඛ්‍යාව කවරේද;

(ii) ඔවුන්ට ලබා දෙන සහනාධාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ ඇති ලියාපදිංචි එක්දින ධීවර යාත්‍රා, බහුදින යත්‍රා, වෙනත් යාන්ත්‍රික නොවන යාත්‍රා සහ මාදැල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ධීවරයින් සඳහා ක්‍රියාත්මක වන රක්ෂණ ක්‍රමය කවරේද;

(ii) එම රක්ෂණ ක්‍රමයේ ස්වභාවය කුමක්ද;

(iii) ඒ සඳහා දායක වී ඇති ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම රක්ෂණ ක්‍රමය සඳහා රජය මගින් සිදුකරන දායකත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2612/'12

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව අධ්‍යාපන විද්‍යාපීඨයේ ශාරීරික අධ්‍යාපන පාඨමාලාව සඳහා පසුගිය කාලයේදී වාර්ෂිකව සිසුන් 120 දෙනෙකු බඳවා ගෙන ඇති බවත්;

(ii) ප්‍රතිපාදන කප්පාදුව හේතුවෙන් 2012 වර්ෂයේදී එම විද්‍යාපීඨයට බඳවාගෙන ඇත්තේ සිසුන් 60ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දිවයිනේ සමස්ත පාසල් පද්ධතිය තුළ ශාරීරික අධ්‍යාපන ගුරුවරු සඳහා පුරප්පාඩු පවතින බවත්;

(ii) 2012 වර්ෂයේදී ඌව අධ්‍යාපන විද්‍යාපීඨයට බඳවාගත් ශාරීරික අධ්‍යාපන සිසුන්ගේ සංඛ්‍යාව අඩකින් අඩුකිරීම හේතුවෙන් ඉහත සඳහන් පුරප්පාඩු සපුරාලීමේ ඉලක්කය සපුරාගත නොහැකි වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ශාරීරික අධ්‍යාපන පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ඇති, ඌව පළාත ඇතුළුව දිවයින පුරා සිටින සිසුන්ට ඉහත තත්ත්වය නිසා මෙම වර්ෂයේදී සිදුවූ අසාධාරණය මගහැරවීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2347/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවන් විසින් සපුරාලිය යුතු, රජය පිළිගත් සුදුසුකම් රාමුවක් තිබේද;

(ii) එසේ නම්, එම සුදුසුකම් හඳුන්වා දෙනු ලැබූ ආයතනය කවරේද;

(iii) වර්ෂ 2010 වනවිට අදාළ සුදුසුකම් සහිතව ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලැබූ පාලිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iv) නියමිත සුදුසුකම් නොමැතිව වර්ෂ ගණනාවක් තිස්සේ ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන පාලිකාවන් සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ගයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2474/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන,

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2012 අගෝස්තු මස 24 වැනි සිකුරාදා)

2475/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2476/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2477/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කලුතර දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනයවන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කලුතර දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2478/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනයවන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2479/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2480/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2481/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මුලතිව් දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2482/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යාපනය දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2483/’12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිළිනොච්චි දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2484/’12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2485/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමූපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2486/'12

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කය තුළ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන;

(i) ධීවර කොට්ඨාස සහ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර කොට්ඨාස හා කලාප තුළ ලියාපදිංචි ධීවර සමිති හා තොටුපල සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ධීවර සමිති හා තොටුපල සංවිධාන කවරේද;

(v) ඉහත ධීවර සමිති හා තොටුපල සංවිධානවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති ධීවර කොට්ඨාස හා කලාපවල ක්‍රියාත්මක වන ධීවර සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම ධීවර සමුපකාර සමිතිවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?